නිපුණතාවය :- 2. ව්‍යාපාර පරිසරයේ බලපෑම්වලට අනුගත වෙමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කරයි .

නිපුණතා මට්ටම :- 2.1. රජයේ බලපෑම් සහ නීති රීති ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව කිරීමට කටයුතු කරයි .

( ව්‍යාපාර පරිසරය හැදින්වීම , ව්‍යාපාර පරිසරය වර්ග කිරීම , ව්‍යාපාර අභ්‍යන්තර සහ බාහිර පරිසර සාධක හැදින්වීම )

ඔබගේ පෙළ පොතේ පිටු අංක 14 සිට 16 දක්වා හොදින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න .

01. ව්‍යාපාර පරිසරය යන්න අර්ථ දක්වන්න .

02. ව්‍යාපාර තම ව්‍යාපාර පරිසරය පිළිබඳ නිරන්තරයෙන් අවධානය යොමු කළ යුත්තේ ඇයි ?

03. අභ්‍යන්තර පරිසරය යන්න හඳුන්වන්න .

04. බාහිර පරිසරයට අයත් සාධක දෙකක් නම් කරන්න .

05. කිතුල්ගල , කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය භෞතික සම්පත් බහුල ප්‍රදේශයකි .එහි ජීවත් වන කුසුම්සිරි සුළු පරිමාණ ලෙස කිතුල් පැණි, කිතුල් හකුරු නිෂ්පාදන කටයුතු සිදු කරන අතර ඒ සඳහ අවශ්‍ය මූල්‍ය පහසුකම් ප්‍රදේශයේ මූල්‍ය ආයතනයක් විසින් ලබා දී ඇත .

ඉහත සිද්ධියේ සඳහන් අභ්‍යන්තර සහ බාහිර පරිසර සාධකය බැගින් නම් කරන්න.

පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න .

01. ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් නෛතික පරිසරය සහ ගෝලීය පරිසරය ලෙස වර්ග කල හැකි ය .(______ )

02. ව්‍යාපාර කටයුතු මෙහෙයවීමට අදාල තීරණ ගනු ලබන්නේ කළමණාකරුවන් විසිනි. ( ______ )

03. සේවකයින්ගේ කැපවීම සහ අයහපත් ආකල්ප ව්‍යාපාරයක සාර්ථකත්වයට හේතු වේ . ( _______ )